

# බයිබල් පුරෝකථන

## දෙවියන්වහන්සේ වැඩ සිටිනා බව ඒත්තු ගන්වන සාක්ෂි

**Bible Prophecy**

- ෆෙඩ් පියර්ස් -

# බයිබල් පුරෝකථන

## දෙවියන්වහන්සේ වැඩ සිටිනා බව එත්තු ගන්වන සාක්ෂි

- ෆෙඩ් පියර්ස් -

# පටුන


හැඳින්වීම

| | |
|---|---|
| පුරෝකථනයේ බලය ඇත්තේ කාහටද ? | 3 |
| බයිබලය අනාගතය ගැන අනාවැකි පවසයිද ? | 5 |
| "එසේය නමුත්.........." | 6 |
| බැබිලෝනිය පිළිබඳ පුරෝකථනය | 7 |
| සම්පූර්ණයෙන්ම පෙරලා දමන ලදී | 8 |
| මිසරයේ ඉරණම | 10 |
| පහත් රාජ්‍යයක් | 11 |
| ඉශ්‍රායෙල් සම්බන්ධ පුරෝකථන | 12 |
| නමුත් තවත් දේ තිබේ. | 14 |
| පුරෝකථන තුනක් - ඉරණම් තුනක් | 17 |
| දැන සිටියේ කවුද ? | 18 |
| බයිබලය සහ ජාතීන් | 18 |
| අභිරහස් හෙළිකරන දෙවිකෙනෙක් | 20 |
| අපගේ කාලයන් | 21 |
| සාමය සහ අභිවෘද්ධිය ? | 22 |
| ලෝක ව්‍යසනය සහ භීතිය | 23 |
| නිගමනයන් | 25 |
| සක්‍රිය සංඝටකය | 26 |
| බයිබල් පුරෝකථන ප්‍රශ්න | 28 |

# බයිබල් පුරෝකථන

## දෙවියන්වහන්සේ වැඩ සිටිනා බව ඒත්තු ගන්වන සාක්ෂි

බයිබලය මහත් අපූර්ව ග්‍රන්ථයකි. නපුරේ සම්භවය පිළිබඳ එහි වාර්තාව, ඉශ්‍රායෙල් ජාතිය සමඟ දෙවියන්වහන්සේගේ ගනුදෙනු පිළිබඳ අසමාන වාර්තා, ඔවුන්ගේ දිවැස්වරු තුළින් එහි සුපරීක්ෂාකාරී පණිවිඩය, යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ අපෝස්තුලුවරුන් විසින් ප්‍රකාශ කරන ලද එහි "සුභාරංචිය", සියල්ලට ඉහලින් මිනිස් ස්වභාවයේ දුර්වලතාවය ගැන එහි නොවරදින විශ්ලේෂණය සහ එහි ප්‍රතිවිරෝධි රූපනයවූ විශේෂයෙන් උන්වහන්සේගේ පුත්‍රයා තුළින් සරලව පෙන්වන ලද දෙවියන්වහන්සේගේ ශුද්ධවූභාවයේ සත්‍යයේ සහ කරුණාවේ චිත්‍රය මේ සියල්ල ලෝකයේ කිසිම ග්‍රන්ථයක සොයාගත නොහැකි විශිෂ්ඨ ලක්ෂණයෝය. වසර 100 කට ඉහතදී හෙන්රි රොජර්ස් හට මෙසේ ප්‍රකාශ කිරීමට ඒවා පෙළඹ විය. "බයිබලය මිනිසාට හැකිවූවා නම් ලියන්නට කැමති නමුත් කැමති වූවා නම් නොලියන්නට හැකි විධියේ ග්‍රන්ථයකි." (එය විසින්ම නිගමනය කල බයිබලයේ සුපිරිමානුෂික සම්භවය) වෙනත් වචන වලින්, එහි පැවැත්ම තේරුම්කර දීමට දෙවියන්වහන්සේ අවශ්‍යය.

මෙම කෙටි කර්තව්‍ය තුළ අපි බයිබලයේ අද්විතිය ලක්ෂණ වලින් එකක් සලකා බලමු. එනම් එහි පුරෝකථනයයි. ස්ථිරවම පුරෝකථනය යනු සරලව අනාගතය පිළිබඳ පේනකීම නොවේ. දිවැස්වරයෙකු, තවකෙකු "වෙනුවෙන් කථාකල" ප්‍රකාශකයෙකු විය. පුරෝකථන වූයේ දිවැසිවරයා දෙවියන්වහන්සේ වෙනුවෙන් ප්‍රකාශ කල පණිවිඩයයි. නමුත් බයිබල් පුරෝකථන තුළ සැහෙන තරමක් "අනාවැකි" හෝ අනාගත ඉසව් ගැන පේන කියන නිසා, මෙතැන අපගේ අභිලාෂය සඳහා එම වචනය එම තේරුමෙන් ගනිමු.

### පුරෝකථනයේ බලය ඇත්තේ කාහටද?

නමුත් පළමුව අපි වැදගත් ප්‍රශ්නයක් නිරාකරණය කරගත යුතු වෙමු. පුරෝකථනයේ බලය අයත් වන්නේ දෙවියන්වහන්සේට පමණක් සහ එය උන්වහන්සේගේ අධිකාරීත්වයේ සාධනයක් ලෙස බයිබලය ප්‍රකාශ කරයිද? යෙසායාගේ පුරෝකථනය තුළ මෙයට තීරණාත්මක පිළිතුරක්

ඇත. 41 වැනි පරිච්ඡේදයේදී තමහට දිව්‍යමය බලය ඇති බැව් ඔප්පු කිරීමට එම දවස්වල පිළිම සහ පිළිම වන්දනාකරුවන් හට දෙවියන්වහන්සේ අභියෝග කරයි. උන්වහන්සේ එය කරන්නේ මෙසේය.

"නුඹලාගේ පැමිණිල්ල ඉදිරියට ගෙනෙල්ලා යයි ස්වාමින්වහන්සේ කියන සේක. නුඹලාගේ බලවත් කාරණා පෙන්වාපල්ලා යයි යාකොබ්ගේ රජ්ජුරුවෝ කියන සේක. ඔවුහු (පිළිම) ඒවා (හේතු) ඉදිරිපත් කොට සිද්ධවෙන්ට තිබෙන දේවල් අපට දන්වත්වා. ඉස්සර දේවල් මොනවාදැයි අප විසින් කල්පනා කොට ඒවායේ කෙළවර දැනගන්නා පිණිස ඒවා අපට දන්වාපල්ලා. නොහොත් පැමිණෙන්ට තිබෙන දේවල් අපට ප්‍රකාශ කරපල්ලා ................." (21-22 පද)

මෙම අභියෝගයේ පදනම පැහැදිළිය. තම පිළිම දෙවිවරුන් බැව් මිථ්‍යාදෘෂ්ටික වන්දනාකරුවෝ පවසත්. බොහෝ යහපත්‍ය. සාක්ෂි ඉදිරිපත් කරන්නට ඔවුනට ඉඩ හරින්න. දෙවියන්වහන්සේ විසින්ම ඉල්ලා සිටින සාක්ෂි නම්, පිළිම අනාගත ඉගැව් ප්‍රකාශ කරන ලෙසත් "පසුගිය දේ" එනම් ආරම්භයේදී මැවීම සිදු වූ ආකාරය විස්තර කරන ලෙසත්‍ය. ඊළඟ පදයේදී කරුණ නිශ්චිතව පැහැදිලි කර ඇත.

"මතු සිද්ධවෙන්ට තිබෙන දේවල් දන්වාපල්ලා. එවිට නුඹලා දෙවිවරුන් බව අපට දැනගන්ට ලැබෙනවා ඇත.........." (23 පදය)

අනාගතය ගැන පැවසීමට හැකිවීම දිව්‍යමය බලයේ සාක්ෂියක් බැව් මෙතැන දෙවියන්වහන්සේම තහවුරු කරයි. යෙසායාගේ පුරෝකථනයේ මෙම කොටසේ එක් අවස්ථාවකට වැඩියෙන් මෙම බලය ඇති එකම තැනන්වහන්සේ තමන්වහන්සේ බැව් දෙවියන්වහන්සේ ප්‍රකාශ කරන සේක. මක්නිසාද උන්වහන්සේ පමණක් දෙවියන්වහන්සේය. වෙන කෙනෙක් නොමැත.

"පුරාණයේ පළමු කාරණා සිහිකරපල්ලා. මක්නිසාද මමම දෙවියන්වහන්සේය, වෙන කෙනෙක් නැත. මම දෙවියන්වහන්සේය. මා සමාන කෙනෙක් නැත. ..............." (46:9)

තමන්වහන්සේ හැර වන්දනාවට යෝග්‍ය වෙනත් කිසි අරමුණක් නොමැති බැව් ඉශ්‍රායෙලයේ දෙවියන්වහන්සේ මෙතැන ප්‍රකාශ කරයි. තවද මෙම වදන්වලින් උන්වහන්සේගේ බලයේ සලකුණු තහවුරු කරයි.

"........... අන්තිමය මුල පටන්ද තවම සිද්ධ නොවුන දේ පුරාණයේ

පටන්ද දන්වන්නා වූ, මාගේ මන්ත්‍රණ පවත්වන්නේය කියාත් මාගේ මුළු කැමැත්ත ඉෂ්ඨ කරන්නෙමියි කියාත් කියන්නාවූ තැනැන්වහන්සේය." (46:10)

එය ගැන සිතන්න, දෙවියන්වහන්සේ හැර මාගේ මන්ත්‍රණ පවත්වන්නේය කියා පවසන්නට එඩිතර කවුරුන්ද? එවන් දෙයක් පවසන්නට හැකි මුළු ලෝකයේම සිටින මිනිසා කවරෙක්ද? එය ක්‍රියාත්මක කිරීමට, ඒවා සිදුවීමට පෙර අනාගත ඉසව් දැනගෙන සිටින පමණක් නොව, උන්වහන්සේ නියම කල ලෙස ඒවා සිදුවන බැව් බැලීමට බලය ඇති කෙනෙකු අවශ්‍යය. වෙනත් වචන වලින්, නියත වශයෙන් ඉටුවන පුරෝකථන කිරීමට, ඔබට දෙවියන්වහන්සේ අවශ්‍යය. වෙනත් කිසිම හේතුවකට එය විස්තර කල නොහැක.

නව ගිවිසුම එම ප්‍රකාශයම කරයි. යේසුස්වහන්සේ තම ගෝලයන්ගෙන් සමුගැනීමට පෙර, ලෝකයේ සුභාරංචිය දේශනා කිරීමේ කර්තව්‍යයට ශුද්ධාත්මයේ උපකාරය උන්වහන්සේ ඔවුනට පොරොන්දු වූහ. මෙම දානයේ එක් ප්‍රතිපලයක් වුයේ, "උන්වහන්සේ....... පැමිණෙන්නට තිබෙන දේ නුඹලාට ප්‍රකාශ කරන සේක." (යොහන් 16:13) යනුයි. වෙනත් වචන වලින්, අනාගත සිදුවීම් වල ඥානයක් ගෝලයන් හට දෙන ලදහ. මෙම විශේෂිත කුසලතාවය නොමැතිව ඔවුනට මෙය කල නොහැකි බැව් මෙයින් හැඟවෙයි. අනාගතය ගැන ප්‍රකාශ කිරීමේ හැකියාව, ඔවුනට දෙන ලද කුසලතාවයේ බලයේ සාක්ෂියක් විය.

නැවතත්, බයිබලයේ අවසාන පොතේ පළමුවැනි පරිච්ඡේදයේ පළමුවැනි පදයේ, "ඉක්මනින් වෙන්නට ඕනෑ දේවල් ........... තමන්ගේ දාසයන්ට දන්වන පිණිස........ දුන්නාවූ............" (එළිදරව් 1:1) ආකාරයට දෙවියන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට එළිදරව් කළ ලෙස ප්‍රකාශ කර ඇත. දෙවියන්වහන්සේ වෙතින් යේසුස් වහන්සේ තුළින් අනාගතය ගැන දැන ගැනීම පැමිණියේය. එම එළිදරව්ව නොමැතිව, එය ගැන කිසිවක් උන්වහන්සේගේ සේවකයන් හට දැනගන්නට නොහැකි වනු ඇත.

නිගමනය පැහැදිලිය. අනාගතය ගැන අනාවැකි කීමේ බලය දෙවියන්වහන්සේ පමණක් සතු බැව් බයිබලය නිශ්චිතවම පවසයි.

## බයිබලය අනාගතය ගැන අනාවැකි පවසයිද?

අනාගතය ගැන කිසිම දැනුමක් මිනිසාගෙන්ම මිනියාට නොමැති බැව් වටහා ගැනීමට අප පරීක්ෂා කල යුත්තේ ඉතිහාසය සහ අපගේම

අත්දැකීම් පමණය. ලබන වසර ඉවත දමා, අද රාත්‍රියේ හෝ හෙට අප සේවය සඳහා යනවිට හෝ කුමක් සිදුවේ දැයි පවා අපි නොදන්නෙමු. වසර 2000කින් නොව වසර 100 කින් හෝ කුමක් සිදුවන්නේද? අනාගය ගැන මද දැනුක් හෝ මිනිසාට තිබී නම්, තිරණ කොතරම් ගණනක් වෙනස්වනු ඇත්ද ! කොතරම් අනතුරු වලක්වා ගත හැකි වීද ! කෙතරම් ව්‍යසන ගණනක් සිදුවීමට ඉඩනොදෙන්නට තිබුනාද ! කෙතරම් යුද්ධ සංඛ්‍යාවක් ආරම්භ නොවී තිබේද ! අපගේම ජීවිතවල අත්දැකීම සහ මිනිසාගේ ඉතිහාසය යන දෙකම අප හට ඒත්තු ගන්වන්නේ, සිදුවන්නේ කුමක්දැයි යන්නෙහි නිසැක දැනුමක් මිනිස් වර්ගයා හට නොමැති බවයි.

නමුත් එක්වරක් නොව, බොහෝ වාර ගණනක් අනාගතය පවසා ඇත්නම් ! ලෝකයේ වෙනත් කිසිම ග්‍රන්ථයක නොව සැමවිටම බයිබලය නමැති එකම ග්‍රන්ථයේ නම් ? එය අප සැලකිල්ලට ගත යුතු නොවේද? බයිබලයේ පුරෝකථනය බොහෝ වැදගත් යැයි පවසන්නේ එබැවිනි. ඒවා මත බොහෝ දේ රඳා පවත්නා හෙයින් ඒවා සැලකිලිමත්ව පරීක්ෂාවට සුදුසුය. මිනිස් වර්ගයාට ඉහළින් ශ්‍රේෂ්ඨ බලයක් ලෝකයේ පවතිනා බවට ඒවා ආකර්ෂණිය සලකුණකි.

## "එසේය, නමුත්......."

බයිබලය දෙවියන්වහන්සේගේ වචනය යැයි නොඅදහන අය එහි පුරෝකථනයට කොහෙත්ම කැමති නැත. අනාගතය ගැන නිවැරදිව අනාවැකි එය කිවායැයි පිළිගන්නේද, දෙවියන්වහන්සේගේ පැවැත්ම පිළිගැනීමේ මාර්ගයේ බොහෝ දුරක් ඔබ ගමන් කර ඇත. එම නිසා ඔවුන් එය තේරුම්කර දීමට පටන් ගනි. "පුරෝකථන සැබවින්ම අනාගතය ගැන අනාවැකි නොවේ ඒවා අනාවැකි කී සිද්ධි සිදුවී පසු ලියූ දෑ" ලෙස ඔවුහු පවසත්. බයිබල් වාර්තා, විශේෂයෙන්ම පැරණි ගිවිසුමේ ඒවා අනාවැකි කියන්නේ යැයි පවසන සිදුවීම් වලට බොහෝ කලකට පසුව ලියැවූයේ යැයි ඔප්පු කරන්නට හැකිනම් පමණක් මෙම තර්කයට බලයක් තිබෙන බැව් පෙන්විය හැකිය. මෙය සඳහා ඍජු සාක්ෂි නොමැති බැව් පැහැදිලිව පැවසිය යුතුය. එම නිගමනය ඔවුන් තමන්ගේම සිද්ධාන්තයට සහයවන ලෙස සාක්ෂි අර්ථ නිරූපණය කිරීමේ ප්‍රතිපලයයි. ඇත්තවශයෙන්ම, ගත වූ වසර 100 පුරා සිදුකල පර්යේෂණ පෙන්වන්නේ බයිබල් වාර්තා අව්‍යාජ බවයි. ඒවා ලියැවූ කාලය ලෙස ප්‍රකාශ කරන කාලයට ඒවා අයිතිය.

නමුත් අපගේ වර්තමාන අභිලාෂය සඳහා වඩා යහපත් කෙටි මාර්ගයක් ඇත. ක්‍රි. පූ. 200 පමණදී පැරණි ගිවිසුම් වාර්තා පැවති බැව් කිසිවකුට ප්‍රතික්ෂේප කළ නොහැකිය. මක්නිසාද එම කාලයේදී පමණ ඒවා

(පැරණි ගිවිසුමේ සෙප්ටුවජින්ට් සංස්කරණය ලෙස හැඳින්වූ) ග්‍රීක බසට පරිවර්තනය කරමින් තිබුණි. නොමැති දෙයක් ඔබට පරිවර්තනය කළ නොහැක.

තවත් විරෝධයක් මෙසේ පවසයි. "හොඳයි, මෙම බයිබල් "අනාවැකි" තම දවස්වල ඉසව් සහ ඒවායේ වියහැකි ප්‍රතිඵල විශ්ලේෂණය කළ හැකිව සිටි අයගේ දක්ෂ දේශපාලනික අනාවැකිය."

ක්‍රිස්තුස්වහන්සේට සියවස් ගණනාවකට ඉහතදී පලකරණ ලද "දක්ෂ දේශපාලනික අනාවැකි" වසර 2000 කට අධිකව වර්තමාන දවස් දක්වා සත්‍යව පවතිද? එවන් හපන්කම් කිරීමට තරම් බයිබල් අනාගත වක්තෘන් කොයිතරම් විජ්ජාකරුවන් දැයි ඔවුන් විශ්ලේෂණය කරන්නේද? එම කරුණ එසේ සඳහන් කිරීම ඔවුන්ගේ වදන්වල කොතරම් විය නොහැකි තේරුම් කිරීමක් ලෙස පෙන්වීමක්ද?

නමුත් අනෙකුත් සියල්ලට මෙන්ම, මෙම විරෝධයට සහතික පිළිතුර එම පුරෝකථන සමහරෙක් කියැවීමයි. එමනිසා අපි මෙයින් ආරම්භ කරමු.

## බැබිලෝනිය පිළිබඳ පුරෝකථනය

ඉශ්‍රායෙලයේ අනාගතවක්තෘන්ගේ දවස්වල (ක්‍රි.පූ. 850-560 පමණ) දැන් ඉරාකය යැයි හඳුන්වන, යුප්‍රටීස් සහ ටයිග්‍රිස් ගංගා වටා ප්‍රදේශයේ මහා යුධමය බලයයන් දෙකක් ඇතිවූහ. පළමුවැන්න වූයේ නිනවේ අගනුවර කරගත් ඇසිරියානු අධිරාජයයි. සියවස් දෙකක් පුරා තමන්වටා සිටි ජාතින්ගේ භූමි ඇසිරියානුන් ආක්‍රමණය කළහ. දකුණු දිගට කැල්දියන්වරු සහ ඔවුන්ගේ අගනුවරවූ බැබිලෝනිය මත ඔවුහු ආධිපත්‍යය පැවැත්වූහ. පෙරදිග දෙසට ඔවුහු සිරියාව අත්පත් කර, මධ්‍යදරණි වෙරළ පහළට ඉශ්‍රායෙල් හරහා මිසරයදක්වා ඉදිරියට ගියෝය. ඔවුන්ගේ ප්‍රතිපත්තිය වූයේ භීතියයි. යටත් වීමට ස්වදේශිය ජනතාව බියවද්වා වාර්ෂික කප්පම් ගැනීම ඔවුන්ගේ අරමුණ විය. මෙම අන්තය සඳහා ඔවුහු නගර වනසා ගිනිබත්කොට, ගම්මාන විනාශකොට, වැසියන් ඝාතනයකොට, දහස්ගණන් ඇසිරියාවේ සිරභාරයට ගෙන ගියහ.

ක්‍රි.පූ. 7 වැනි සියවසේ දෙවැනි භාගය, ඇසිරියානු බලයේ බැස්මත් බැබිලෝනියේ නැගිමත් දුටුවේය. ක්‍රි. පූ. 612 දී නිනවේ යටත් කර ගන්නා ලදි. කැල්දියන්වරුන්ගේ රජුවූ නෙබුකද්නසර් වේගයෙන් නව

අධිරාජ්‍ය නිර්මාණය කළේය. ඇසිරියාවෙන් විමුක්තිය ලැබුනා යැයි ප්‍රබෝදමත් වූ මැදපෙරදිග කුඩා ජාතීහු, බැබිලෝනියානු හමුදා විසින් අත්පත් කරගන්නා ලදී. විශේෂිතව නෙබුකද්නසර් ඉශ්‍රායෙලය අත්පත් කර, යෙරුසලෙම විනාශකොට එහි දේවමාලිගය ගිනිබත්කොට දහස් ගණන් දෙනා බැබිලෝනියේ සිරභාරයට ගෙන ගියේය. ඔහු ඉන්පසු තවත් දකුණට ගොස් මිසරය ආක්‍රමණය කළේය. යුප්‍රටීස් ප්‍රදේශයෙන් මතුවූ හමුදා ආධිපත්‍යයේ මෙම අදියර බැබිලෝනියානු අධිරාජ්‍යය විය.

විශේෂිතව නෙබුකද්නසර්, එහි ශ්‍රේෂ්ඨ රජු, බැබිලෝනිය මැත පෙරදිග ලෝකයේ විශ්මයක් කළේය. ඔහු අති විශාල දේවස්ථාන සහ මාළිගා තනවා, යෝධ ආරක්ෂිත තාප්පයකින් නගරය වට කළේය. බැබිලෝනිය, නෙබුකද්නසර්ගේ සහ ඔහුගේ කැල්දියන් ජනතාවගේ විභූතිය සහ අභිමානය විය.

කුඩා ජාතින්ගේ වැසියන් මත එවන් කුරිරු බලයක් සහ ධනයක බලපෑම වටහා ගැනීමට අද දවසේ සිටිනා අපහට දුෂ්කරය. ඔවුන් සඳහා ඇසිරියානු සහ බැබිලෝනියානු අධිරාජ්‍යයන් බිය ජනක සහ අනභිභවනීය වන්නට ඇත.

## <u>සම්පූර්ණයෙන්ම පෙරලා දමන ලදී.</u>

නමුත්, තම බලයේ උච්චස්ථානයට බැබිලෝනිය පත්වන්නට පෙර වසර 100 කට පෙර, එහි පෙරලා දැමීම ඉතා නිශ්චිත වදන්වලින් අනාගතවක්තෘ යෙසායා අනාවැකි කීය. “බැබිලෝනියේ පීඩාව” ලෙස ශීර්ෂ ගත කළ පරිච්ඡේදයක ඔහු පැවසුවේ මෙයයි.

> "...........ස්වාමීන්වහන්සේගේ දවස ලංව තිබේ. එය සර්ව පරාක්‍රමයාණන් විසින් එවන විනාශයක් මෙන් පැමිණෙයි.......... බලව, මම මේදවරුන් ඔවුන්ට විරුද්ධව පොළඹ වන්නෙමි....... රාජ්‍ය වල අලංකාරයද කල්දිවරුන්ගේ උඩගුකමේ තේජසද වූ බැබිලෝනිය දෙවියන්වහන්සේ විසින් නාස්ති කළ සොදොමටද ගොමොරාවටද සමාන වන්නේය. එහි කවදාවත් වැසියෙක් නොවන්නේය........ අරාබියා එහි තමාගේ කූඩාරම් තබාගන්නේවත් එඬේරු තමුන්ගේ බැටළුවන් එහි ලග්ගවන්නේවත් නැත. වන මෘගයන් එහි ලගිනවා ඇත."(යෙසායා 13:6, 17, 19-21)

බැබිලෝනියේ ඉරණම පැහැදිලිය : ප්‍රහාරකරුවන් මේදවරු වනු ඇත. (බැබිලෝනියට නැගෙනහිරින් වූ ජාතියක්) නගරය, මිනිසා හෝ

මෘගයා නොවසන හුදෙකලා එකක් වනු ඇත. බැබිලෝනිය එය තම බලයේ සහ තේජසේ උච්චස්ථානයට නැගීමට වසර 100 කට පෙර මෙම පැහැදිලි පුරෝකථනය කියැවූ බැව් අප සිහිතබා ගනිමු.

තවත් අනාගතවක්තෘවරයෙක්, යෙරමියා, වසර 100 කට පසු නෙබුකද්නසාර් යෙරුසලමට පහරදීමට ආසන්නව සිටියෙදී බැබිලෝනියේ බිඳ වැටීම ගැන අනාවැකි කිවේය.

"මම බැබිලෝනියට විරුද්ධව............නාස්තිකරන සුළඟක් හටගන්වන්නෙමි............බැබිලෝනිය හදිසියෙන් වැටී විනාශ වූවාය............ මේදයේ රජවරුන්ද.......... ඈට විරුද්ධව (බැබිලෝනිය) සූදානම් කරපල්ලා............ බැබිලෝනිය වැසියෙක් නැතිව ජරාවාස ගොඩවල්ද සිවලුන්ගේ වාසයක්ද විශ්මයක් ද කවටකමක්ද වන්නේය.............. බැබිලෝනියේ පළල්වූ පවුරු සහමුලින්ම හෙළා දමනු ලබන්නේය. ඈගේ උස් දොරටුද ගින්නෙන් දවනු ලබන්නේය........... අහෝ ස්වාමීන්වහන්ස, මේ ස්ථානයෙහි මනුෂ්‍යයෙක් වූවත් මෘගයෙක් වූවත් කිසි වැසියෙක් නැතිව එය සදාකාල පාළුවක් වෙන හැටියට එය සිඳ දැමීමට ඔබ ඊට විරුද්ධව කථා කර තිබේ.........."

අවසානයේදී, පුරෝකථන ලේඛනයේ ගලක් ගැටගසා මෙසේ පවසමින් එය යුප්‍රටීස් නදියට හෙලීමට දිවැසිවරයාහට අණ කරනු ලබයි.

"මෙසේම බැබිලෝනිය කිඳී............ ගොඩ නොඑන්නේය.........." (යෙරමියා 51:1, 8, 28, 37,58, 62-64)

බැබිලෝනිය බලයට එන්නට වසර 100 කට පෙර යෙසායාගේ සහ අධිරාජ්‍යය සහ නගරය තම තේජසේ උච්චස්ථානයට පැමිණි අවස්ථාවේ යෙරමියා ලේඛනගත කළ පුරෝකථන අතර එකඟතාවය සම්පූර්ණය. එම දවස්වල ජනතාව සඳහා එය, මහා නගරයක්වූ ලන්ඩන්, නිව්යෝර්ක් හෝ සිඩ්නි සාදාකාලයටම පාළුවට යන්නේ යැයි අපහට පවසන සේ ඇසෙන්නට ඇත. න්‍යෂ්ටික ආයුධ ඇති මෙම යුගයේ එවන් ඉරණමක් ඇදහීමට නොහැකි කමක් නැත. නමුත් ඉශ්‍රායෙල් දිවැසිවරු තම අනාවැකි පැවසුවේ, එවන් පූර්ණ විනාශ විය හැකි යැයි සිහිනයෙන් පවා නොසිතූ වසර 2500 කට වඩා ඉහතදීය.

බැබිලෝනියේ ඉරණම ගැන පුරෝකථන ක්‍රමක්‍රමයෙන් සම්පූර්ණ වූ සැටි ඉතිහාසය එළිදරව් කරයි. පළමුවැනි කොල්ලකරුවන් වූයේ ක්‍රි.පූ.

6 වැනි සියවසේ මීද සහ පර්සියන්වරු - එම අවස්ථාවේ සිට බැබිලෝනියේ තේජස මැලවෙන්නට පටන් ගති. ඉන්පසු මහා ඇලෙක්සැන්ඩර් යටතේ ග්‍රීකවරු, සහ ඉන්පසු රෝමානුවන් පැමිණියහ. ඔවුනට පසු පාර්තියන්, ආරාබි සහ ටාර්ටර් වැනි විවිධ යුධකාමී ගෝත්‍ර පැමිණියහ. සියවස් ගණනාවක් බැබිලෝනි නගරය පැවති ස්ථානය නටබුන් ගොඩැල්ලක් වූ අතර, තැනින් තැන යන එඬේරන් විසින් - සංචාරකයන් එසේ අපට පවසයි. මග හරින ලද 19 වැනි සියවසේ පළමු භාගයේදී එම ස්ථානය පුරාවිද්‍යාඥයන් විසින් ගවේශණය කිරීම ඇරඹුන විට පමණක් මහා තාප්පවල නටඹුන්, ශ්‍රේෂ්ඨ දේව මාළිගා සහ දොරටු, සහ දැවැන්ත පිළිම, එම දවස්වල බැබිලෝනිය කෙතරම් උත්කෘෂ්ට පෙනෙන්ට ඇතිදැයි විශ්මයට පත් ලෝකයකට එළිදරව් විය.

එසේ "රාජ්‍යයන්ගේ තේජස" වූ බැබිලෝනිය, ඉශ්‍රායෙල් අනාගත වක්තෘන් පැවසූ පරිදි නටබුන් සහ ශූන්‍ය වූ සැටි ඉතිහාසය එළිදරව් කරයි.

දැන් අප බයිබල් පුරෝකථන සත්‍යයේ දෙවැනි සහ වෙනස් උදාහරණයක් දෙස හැරෙමු.

## මිසරයේ ඉරණම

මිසරය, මැදපෙරදිග ශ්‍රේෂ්ඨ බලයක්ව පැවතුනි. ක්‍රි.පූ. 1600 පමණ එහි ශ්‍රේෂ්ඨ යුගය විය. එකල ජයග්‍රාහි පාරාවෝවරුන්ගේ හමුදා දකුණු දිගට සුඩානය, බටහිරට උතුරු අප්‍රිකානු වෙරළ තීරය දිගේ සහ උතුරු දිගට කනාන් දේශය (පසුව ඉශ්‍රායෙල්) හරහා සිරියාවට බලපැවැත් විය. මිසරයේ සමහර පුරාණ දේවමාළිගා, ස්මාරක සහ සොහොන් වල සොයාගැනීම්, තම බලයේ උච්චස්ථානයේ සිටි පාරාවෝවරුන්ගේ තේජස එළිදරව් කර ඇත.

නමුත් ක්‍රි.පූ. 1400 පමණ සිට මිසර බලය, සිවිල් යුද්ධය, ඇසිරියාවේ නැගීම සහ පසුව බැබිලෝනිය නිසා පිරිහීමට පටන් ගති. එසේ නමුත් කනාන් දේශය ඉශ්‍රායෙලය අයත්කරගෙන සිටි යුගයේ, ක්‍රි.පූ. 1400-600 විවිධ සාර්ථකත්වයන් සමඟ මැදපෙරදිග දේශපාලනය තුළ මිසරය වරින්වර ඇඟිලි ගැසිය. ඇසිරියානු හෝ බැබිලෝනියානු ආක්‍රමණ වලට බියෙන් ඉශ්‍රායෙලිතයන් තම දෙවියන්වහන්සේ තුළ විශ්වාසය තබනවා වෙනුවට මිසරයේ සහය අපේක්ෂා කිරීමට නිතර පෙළඹුනහ.

මිසරවරුන්ගේ ඉරණම ගැන නිශ්චිත යමක් පැවසීමට ඉශ්‍රායෙල්

දිවැසිවරුන්ට තිබුනි. අනාගතවක්තෘ එසකියෙල් ක්‍රි.පූ. 600 පමණ බැබිලෝනි රජුවූ නෙබුකද්නසර් දවස් වල කළ ප්‍රකාශ පැවසුවේ, දෙවියන් වහන්සේගේ විනිශ්චයේ ප්‍රතිපලයක් ලෙස මිසරය වසර 40 ක් ජන ශුන්‍යව පවතින බවයි. ඉන් පසුව පුනරුදයක් පැමිණෙන නමුත් එය කලින් තිබූ තේජස හෝ බලයෙන් යුතුව නොවේ.

"ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ කියන සේක. සතළිස් අවුරුද්දකට පසු, මිසරවරුන් විසිරී ගිය ජනයන් අතරින් ඔවුන් රැස් කරන්නෙමි......... ඔවුන්ගේ ජන්ම දේශය වූ පත්‍රොස් දේශයට ඔවුන් නැවත පමුණුවන්නෙමි. ඔවුන් වනාහි එහි පහත් රාජ්‍යයක්ව සිටිනවා ඇත. එක අනෙක් රාජ්‍ය වලට වඩා පහත්ව ජාතීන් කෙරෙහි තවත් උසස් නොවී තිබෙන්නේය. ඔවුන් අඩුකරන්නෙමි....... ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ කියන සේක. මම දේවරූපද නැතිකොට, නොප් (මෙම්ෆිස්) වෙතින් පිළිම පහ කරන්නෙමි. අධිපතියෙක් මිසර දේශයෙන් තවත් නොකික්මෙන්නේය..........." (එසකියෙල් 29:13-15, 30:13)

නැවතත් පුරෝකථනයේ අදහස පැහැදිලිය. ආක්‍රමණයේ විනාශයත් සහ සිරකරුවන්ගේ පිටුවහල් කිරීම විඳීමට මිසරයට සිදුවිය. මෙම සිද්ධි වල නියත ඓතිහාසික වාර්තා ඉතිරි වී නැතත්, ඒවා එසකියෙල් පුරෝකථනය කළ (එසකියෙල් 30:17-20 බලන්න.) බැබිලෝනිවරුන් විසින් මිසරය ආක්‍රමණය කිරීමේ ප්‍රතිඵලය වන්නට පිළිවන. නමුත් එය මිසරයේ අවසානය වන්නට නොතිබුනි. මක්නිසාද, වසර 40 කට පසු සිරකරුවන් තම දේශයට නැවත පැමිණෙන්නට තිබුණි. රාජ්‍යයක් වශයෙන් මිසරය විනාශ නොවන්නට තිබුණි. එය බොහෝ සේ අඩු කරන ලද බලයකින් පවතින්නට තිබුණි. තව දුරටත් අවට ජාතීන් මත බල නොපවත්වන විධියේ "පහත් රාජ්‍යයක්".

## පහත් රාජ්‍යයක්

එය එසේ සිදුවිය. ක්‍රි.පූ. 600 පමණ සිට අනුක්‍රමික ජයග්‍රාහී ආක්‍රමණිකයන්ගේ ආධිපත්‍යයකට මිසරය ගොදුරු විය. පළමුව ක්‍රි.පූ. 6 වැනි සියවසේ බැබිලෝනිවරු ඉන්පසු 6 වැන්නේ සිට 4 වැනි සියවස් දක්වා පර්සියන් ඉන්පසු 4 වැනි සියවසේ ග්‍රීකවරු ඉන්පසු ක්‍රි.පූ. 1 වැනි සියවසේ සිට ක්‍රි.ව. 5 වැනි සියවස දක්වා රෝමවරු, ක්‍රි.ව. 7 වැනි සියවසේ සිට අරාබි සහ තුර්කිවරු විසින් එය ආක්‍රමණය කරන ලදී. බ්‍රිතාන්‍ය පවා 19 වැනි සියවසේ කාලයක් මිසරය පාලනය කළේය. වසර 2500 ක්, එසකියෙල් පුරෝකථනය කළ පරිදි, මිසරය සැමවිටම අන්‍යයන්

විසින් ආධිපත්‍යය දරන ලද "ශක්ත රාජ්‍යයක්" ව පැවත ඇත. නමුත් මිසරය සහ මිසරවරු අදෘශ්‍යමාන නොවිය. ඔවුන් අදත් පවතින අතර අමෙරිකා එක්සත් ජනපදයේ සහ සවුදි ආරාබියාවේ දැවැන්ත මූල්‍යමය සහයට ස්තූතිවන්නට, මෑත දිනවල නිදහසේ ප්‍රමාණයක් යලි අයිතිකරගෙන ඇත.

අනාගත සිද්ධිවල බයිබල් අනාවැකි තුළ තුන්වැනි උදාහරණයක් අප සලකා බලන අතර, මිසරයේ කරුණ අපගේ මනසේ තැන්පත් කර තබමු.

## ඉශ්‍රායෙල් සම්බන්ධව පුරෝකථන

අනාවැකිවල විස්තරාත්මකභාවය සහ ඒවායේ සත්‍යතාවය ගැන ඓතිහාසික තහවුරු කිරීම් වල සුලභ තාවය තුළ වඩාත්ම පොහොසත් වන්නේ මේවාය. ඉශ්‍රායෙලයේ අපූර්ව ඉරණම සම්බන්ධව සරල කරුණු කෙරෙහි අපි අප සීමාකර ගනිමු.

පසුව පලස්තිනය යැයි හැඳින්වූ, කනාන් දේශය උරුමකර ගැනීමට තම පැවත එන්නන් ජනතාවක් (ඉශ්‍රායෙල්) වන බැව් අනෙකුත් කරුණු අතර හැඟවූ, ආබ්‍රහම් (ක්‍රි.පූ. 1800 පමණ) හට දෙවියන්වහන්සේ නිශ්චිත පොරොන්දු දුන් සැටි පැරණි ගිවිසුම අප සඳහා වාර්තා කරයි. ක්‍රි.පූ. 1400 පමණ මෝසෙස් යටතේ නික්මයාමේදී ඉශ්‍රායෙල් ජනතාව මිසරයෙන් පිතට ගෙන ආ අතර, වසර 40 කට පසුව ඔවුන් පොරොන්දු වූ දේශය අයත් කර ගැනීම ඇරඹිය. නමුත් ඔවුන් තවමත් කාන්තාරයේ සිටියේදී, ඔවුන් දේශයට ඇතුළු වීමට ප්‍රථම, මෝසෙස් තුළින් දෙවියන්වහන්සේ ඔවුන් පිළිම වන්දනාවට සහ මිත්‍යාදෘශ්ඨික කනාන්වරුන්ගේ මාර්ග අනුකරණය කිරීමට තම දෙවියන්වහන්සේගෙන් ඉවතට හැරේ නම් ඔවුන් අභිබවන විපාකය ගැන ගාම්භීර ලෙස අනතුරු හැඟවිය. ද්විතිය කථාවේ 28 පරිච්ඡේදය, ඔවුන් අකීකරු වුවහොත් ඉශ්‍රායෙලිතයන් මත පතිතවන ව්‍යසන ගැන අපූර්ව අවවාදයකි. - එය බිහිසුණු අවවාදයක් විය. සම්පූර්ණ පරිච්ඡේදයම කියවන්නට කියවන්නා හට යෝජනා කෙරේ. අපහට මෙතැන ඉඩ ඇත්තේ ප්‍රධාන ලක්ෂණ සංක්ෂේප කිරීමට පමණි.

"නමුත් මා විසින් අද නුඹට අණ කරන නුඹේ දෙවි වූ ස්වාමීන් වහන්සේගේ සියලු ආඥාද පනත්ද පවත්වන්නට බලාගන්න හැටියට නුඹ උන්වහන්සේගේ හඬට කන් නොදෙන්නෙහි නම්,............... ස්වාමීන් වහන්සේ නුඹද නුඹ කෙරෙහි නුඹ පත්කරගන්නා රජුද නුඹවත් නුඹේ

**පියවරුන්වත් දැන නොගත් ජාතියක් වෙතට පමුණුවන සේක. එහිදී.......... සියලු ජනයන් අතුරෙහි නුඹ මවිතයට හේතුවක්ද උපමාවක්ද නින්දා කිරීමක්ද වන්නෙහිය. ............... පොළොවේ එක් කෙළවරක පටන් අනික් කෙළවර දක්වා සියලු මනුෂ්‍ය වර්ගයන් අතරෙහි ස්වාමින්වහන්සේ නුඹ විසිරුවා දමන සේක. .................. ඒ ජාතීන් අතරෙහි නුඹට කිසි පහසුවක් ......... නොලැබෙන්නේය." (ද්විතීය කථාව 28:15, 36-37, 64-65)**

නැවතත් පුරෝකථනය පැහැදිලිය. අවමානය සහ පිළිකුල්භාවයේ වස්තුවක් ලෙස, ඉතා අපහසු වටපිටාවක් සමඟ ජීවත්වීමට ජාතීන් අතර ඉශ්‍රායෙල් විසිරුවන්නට තිබිණ. මෙම වදන්වල සත්‍යතාවය කෙතරම් බලවත් ලෙස ඔවුන්ගේ ඉතිහාසය ඔප්පුකර ඇත්ද? ලෝකය පුරා යුදෙව්වන්ගේ විසිරුවා හැරීම ක්‍රි.පූ. 8 වැනි සියවසේ ඇසිරියානුන්ගේ දවස් වල ආරම්භ විය. 6 වැනි සියවසේදී බැබිලෝනියානුන් තුළින් මෙම ක්‍රියාවලිය දිගටම කෙරිණ. පර්සියානු රජවරුන්ගේ දවස්වල බැබිලෝනියේ සිට නැවත අර්ධ පැමිණීමක් ඇතිවූ අතර ක්‍රි.පූ. 500 පමණ සිට ක්‍රිස්තුස්වහන්සේගේ දවස් දක්වා පර්සියානු, ග්‍රීක සහ ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන් සහ අවසානයේ රෝමවරුන්ගේ ක්‍රමික ආධිපත්‍යය යටතේ ඉශ්‍රායෙලිත ප්‍රජාවක් තම භූමියේ ජීවත් වූහ. ක්‍රි.ව. 70දී, ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසියගත වීමෙන් වසර 40 කට පසුව, මහත් භයානක ව්‍යසනය එහි සිදු විය. කැරැල්ල නිසා රෝම හමුදාව විසින් යෙරුසලම් නගරය වනසනු ලැබීය. දේව මාළිගය ගිනිබත් කළ අතර රෝමානු ලෝකය පුරා සිරකරුවන් ලෙස යුදෙව්වෝ විසිරවනු ලැබුවෝය. එදා සිට ප්‍රත්‍යක්ෂව ඔවුන් "පොළොවේ එක් කෙළවරක පටන් අනෙක් කෙළවර දක්වා" හමුවේ.

ඉතා මෑත කාලය දක්වා ඇත්තවශයෙන්ම ඔවුන්හට "පහසුවක් නොලැබිනි". පීඩාව සහ විටෙක සමූල ඝාතනය විඳිමින් - 19 වැනි සියවසේ රුසියාව තුළ සංවිධිත ඝාතන සහ 20 වැනි සියවසේ හිට්ලර්ගේ මිනිස් සංහාරයේ ප්‍රතිපත්තිය ඉතා මෑත උදාහරණ පමණි. යුදෙව්වන් සැමතැන්ම අපහාසය සහ සමච්චලයට බඳුන් වී ඇත්තේ, හඳුනාගත හැකි ජාතියක් ලෙස ඔවුන්ගේ පැවැත්ම ඉතිහාසයේ විශ්මයන්ගෙන් එකක් කරමිනි. වසර 2500 කට අධිකව මෙම ඉශ්‍රායෙල් ඉරණමේ පුරෝකථනයේ සත්‍යතාවය නැවතත් අපි නිරීක්ෂණය කරමු. විසුරුවා හැරීම සහ පීඩාවන්ට එරෙහිව, අද දවස දක්වාම, සියවස් ගණනාවක් තුළ හඳුනාගත හැකි ජාතියක් ලෙස යුදෙව්වන් සිටියැයි ඉදිරිය දැකිය හැකිවූයේ කාටද?

<u>නමුත් තවත් දේ තිබේ.</u>

නමුත් ඉශ්‍රායෙල්ගේ ඉරණම සම්බන්ධව පුරෝකථනවල මහත් ඇදහිය නොහැකි ලක්ෂණය තවමත් කීමට ඉතිරිව ඇත, මක්නිසාද ඉශ්‍රායෙල් භාග්‍යයන්ගේ බලාපොරොත්තු නොවූ විපර්යාසයක් ගැන අනාගතවක්තෘන් පැහැදිළි අනාවැකි පවසන හෙයිනි. ක්‍රිස්තුස්වහන්සේට පෙර වසර 60 කට ආසන්නව, අනාගතවක්තෘ යෙරමියා තුළින් දෙන ලද මෙම අනාවැකිය සලකා බලන්න.

> "මා විසින් මාගේ සෙනගවූ ඉශ්‍රායෙල්වරුන්ගේත් යුදාවරුන්ගේත් වහල්කම පහකරණ දවස් පැමිණෙන්නේයැයි ස්වාමීන් වහන්සේ කියන සේක. මම ඔවුන්ගේ පියවරුන්ට දුන් දේශයට ඔවුන් නැවත ගෙනෙන්නෙමි. ඔවුන්ද එක භුක්ති විඳින්නෝය......." (30:3)




බැබිලෝනියානු අධිරාජ්‍යය


මීදෝ - පර්සියානු අධිරාජ්‍යය


ග්‍රීක අධිරාජ්‍යය


රෝමානු අධිරාජ්‍යය

"ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමින්වහන්සේ මෙසේ කියන සේක........... බලව, මාගේ උදහසින්......... මා විසින් පන්නා දැමූ සියලු රටවලින් ඔවුන් රැස්කරගෙන නැවත මෙම ස්ථානයට පමුණුවා සුවසේ වාසය කරන්නට සලස්වන්නෙමි. ඔවුහු මාගේ සෙනඟ වන්නෝය. මමද ඔවුන්ගේ දෙවියන්වහන්සේ වන්නෙමි......." (32:36-38)

"යුදාවරුන්ගේ වහල්කමත් ඉශ්‍රායෙල්වරුන්ගේ වහල්කමත් මම පහකොට මුලදී මෙන් ඔවුන් ගොඩ නගන්නෙමි......... ඔවුන්ගේ සියලු අයුතුකමෙන් ඔවුන් පිරිසිදු කරන්නෙමි........" (33:7)

නැවතත් දිවැසිවරයා ප්‍රකාශ කරන දේ ගැන සැකයක් නැත. ඉශ්‍රායෙලයේ විසුරුවීමේ සහ පීඩාවේ ක්‍රියාවලිය ආපසු හැරවීමට ඇත. වසර 1900 කට පෙර එලවා දමනු ලැබූ භූමියටම නැවත යුදෙව්වන් පැමිණීමට ඇති අතර, එහි සාපේක්ෂ සාමයකින් ජීවත් වීමට ඇත. ඉහත සඳහන් කළ, යෙරමියාගේ කෙටි උපුටා දැක්වීම්, යෙසායා සහ එසකියෙල්ගේ එවන් ප්‍රකාශ වලින් බොහෝ වාරයක් ගුණකල හැකිය.

ඉශ්‍රායෙල්ගේ ප්‍රතිස්ථාපනය ගැන මෙම පුරෝකථන ඉතා නිවැරදි ලෙස සම්පූර්ණ වීම පෙන්වීම සඳහා මහත් විස්තර කිරීම් වලට යාමට අපට අවශ්‍ය නැත. 19 වැනි සියවසේ අගභාගයේ බොහෝ රටවල සිටි විසුරුණු යුදෙව්වන් අතර සියොන්වාදී ව්‍යාපාරය ක්‍රියාකාරී විය. 1917 දී පලස්තීනය යුදෙව්වන් සඳහා ජාතික ගෘහයක් ලෙස ස්ථාපිත කිරීම භූමිය මත ඔවුන්ගේ සංඛ්‍යාවේ ශීඝ්‍ර වැඩි වීමකට තුඩු දුන්නේය. මෙය අරාබින්ගේ එදිරිවාදිකම් ප්‍රකෝප කළ විට 1948 දී තමන් මර්දනය කිරීම සඳහා ගත් තැතක් යුදෙව්වන් වලක්වූ අතර තමන්ගේම යුදෙව් රාජ්‍යය ස්ථාපිත කළෝය. දින හයේ යුද්ධයේදී දෙවැනි උත්සාහයෙන් පසු 1967 දී මෙය විශාල කරණ ලදී. එහි ප්‍රතිපලයක් වශයෙන්, වසර 2500 කට පසු පළමුවරට, යෙරුසලෙම තමන්ගේ පාලනය යටතේ රාජ්‍යයේ අගනුවරවූ අතර ඔවුන්ගේ බොහෝ පෞරාණික ඓතිහාසික ප්‍රදේශ ඉශ්‍රායෙල් නැවත ලබාගන්නා ලදී. කෙටියෙන් මැදපෙරදිග නිදහස් යුදෙව් රාජ්‍යයක මතුවීම මහත්සේ අපේක්ෂා නොකල වර්ධනයක් වී තිබේ. වසර 100 කට අඩු ප්‍රමාණයකින් එපිට, එය සිදු විය හැක්කක් සේ කිසිම දේශපාලනික නිරීක්ෂකයෙකු නොසිතුවේය.

අපි මෙතැන එම තත්වයේ "දේශපාලනය" ගැන සැලකිල්ලමත් නොවන්නෙමු. අපගේ මුළු සැලකිල්ල බයිබල් පුරෝකථන සමඟය. යුදෙව්වන් ගැන බයිබලයේ තවත් දේ කීමට ඇත. උදාහරණයකට, මැදපෙරදිග මහා අර්බුදයක් ඇතිවන බවත්, තම දෙවියන්වහන්සේ

ඉදිරියේ ඉශ්‍රායෙල් මහස්ථාප වීමට ගෙමෙන බවත් දිවැස්වරු අපට පවසත්. එවිට පමණක් අවසන් ප්‍රතිස්ථාපනය සහ සාමය ඇතිවනු ඇත. අප මෙතැන පූර්ණව අවධාරණය කිරීමට කැමැත්තේ තමන්ගේ භූමියට ඉශ්‍රායෙල් නැවත පැමිණෙන බැව් දිවැස්වරු ප්‍රකාශ කළ බව සහ මෙම සියවසේ අප සැබැවින්ම ඔවුන්ගේ අනාවැකි සම්පූර්ණ වීම දුටු බවත්ය.

## පුරෝකථන තුනක් - ඉරණම් තුනක්

අප මෙතෙක් සමාලෝචනය කළ දේ සංක්ෂිප්ත කිරීම මෙම ලසණයේදී ප්‍රයෝජනවත් විය හැක.

<u>**බැබිලෝනිය,**</u> මැදපෙරදිග ශ්‍රේෂ්ඨ බලය, තම අධිරාජ්‍යය සහ අත්‍යාලංකෘත අග නගරය, මීනියා සහ මෘගයා විසින් අත්හරින ලදුව ජන ශූන්‍ය නටබුන් ගොඩැල්ලක් බවට පත්වන්නට තිබුණි. එය එසේ සිදුවිය.

<u>**මිසරය,**</u> තවත් ශ්‍රේෂ්ඨ අධිරාජ්‍යයක්, හඳුනාගත හැකි රාජ්‍යයක් ලෙස පවතින්නට තිබුණි. තම භූමිය ව්‍යාස්ථානය කරගෙන සිටීමට මිසරවරුන්ට තිබුණි. නමුත් "පහත් රාජ්‍යයක්" ලෙස පවතිමින්, නිතරම අනෙකුත් බලයන්ගේ ආධිපත්‍යයට යටත්ව සිටිය යුතුය. ඔවුන් හට එසේ වී ඇත.

<u>**ඉශ්‍රායෙලයේ,**</u> ඉරණම මේ දෙකටම වෙනස් ලෙස විය. තමන්ගේම භූමියෙන් අනෙකුත් රටවලට විසුරුවන ලදුව, දැඩි පීඩා සහ නිරන්තර පිළිකුල විඳිමින් සිට, තමන් විසුරුවන ලද දේශයටම නැවත ඔවුන් පැමිණීමටත්, නැවත වරක් එහි තමන් ස්ථාපිත කිරීමටත්ය.

**පහත සඳහන් කරුණු අවධානයෙන් පරීක්ෂා කර බලමු:-**

1. මෙම ජාතීන් අරබයා කරන ලද පුරෝකථන වසර 2500 කට පමණ ඉහතදී ප්‍රකාශ කරන ලදී.
2. වර්තමාන දවස දක්වා ඒවායේ සත්‍යතාවය ඉතිහාසය තුළ ප්‍රදර්ශනය කර ඇත.
3. උපුටා දැක්වූ කරුණු තුන, <u>සම්පූර්ණයෙන් වෙනස් ඉරණම් තුනක්</u> සමඟ වෙනස් බලයයන් තුනක් ගැන සැලකිලිමත් වෙති. එකක් මතකයෙන් ඔබ්බට අදෘශ්‍යමාන වීමටය. දෙවැන්න පැවතුනත් අනෙකුත් ජාතීන්හට යටත්වීමටය. තෙවැන්න විනාශ වීමටත්, එහි ජනතාව පලවා, මුළු පෘතුවිය පුරා විසුරුවා හැර, නමුත් අවසානයේදී මුල් භූමියේ ප්‍රතිස්ථාපනය කිරීමටත්ය.

4. මේවා දක්ෂ දේශපාලනික නිරීක්ෂකයන්ගේ "දේශපාලනික අනාවැකි" නොව නිශ්චිත අනාගත වාක්‍යය.

## දැන සිටියේ කවුද?

මෙවැනි කාල පරිමාණයක පුරෝකථන පුළුවන් වූයේ කෙසේද? ඇත්තේ එකම බුද්ධිගෝචර පිළිතුරකි. කල්තියා කවුරුන්හෝ දැන සිටින්නට ඇත. නමුත් දැනගත හැකිවූයේ කාටද? නිසැකවම වසර 2500 කට පෙර මිනිසුන් හෝ එතැන් පටන් හෝ කිසිවකුට පුළුවන්කමක් නැත. තනි මිනිස් පදනමකින් මෙම පුරෝකථන තේරුම් කල නොහැක. නමුත්, පැරණි ගිවිසුමේ දිවැස්වරු ඔවුන්ගේ අනාවැකි ගැන මිනිස් බලයයන්ගේ හිමිකම් නොකීවෝය. දෙවියන්වහන්සේ විසින් අනුග්‍රාහික වචන කථාකල බැව් ඔවුහු පැවසුවෝය. ඔවුන් පවසන සියල්ලේ නිරන්තර හැඳින්වීම "දැන සිටියේ" කවුරුන්දැයි අප වටහා ගත්තෙමු. වෙනත් කිසිම බුද්ධිගෝචර තේරුම්කර දීමක් නොමැත. අප සලකා බැලූ පුරෝකථනය, ඒවායේ කර්තෘ ලෙස දෙවියන්වහන්සේගේ පැවැත්ම ඉල්ලා සිටී.

දැනටමත් උපුටා දක්වා ඇති උදාහරණ තුන සිතාමතාම තෝරාගන්නා ලද්දේ බයිබල් පුරෝකථනයන්ගේ විවිධත්වය පැහැදිලි කිරීමටය. නමුත් වෙනත් බොහෝ උදාහරණද ඇත. නිදසුනක් ලෙස, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන සැලකිලිමත් වන ඒවා පරීක්ෂා කිරීමට අපට හැකිය. උන්වහන්සේ ආබ්‍රහම්ගේ දාවිත්ගේ රේඛාවේ සිටින්නට උවමනා විය. උන්වහන්සේ බෙත්ලෙහෙමේ උපත ලබන්නට උවමනා විය. උන්වහන්සේ තමන්ගේම ජනතාවගෙන් ප්‍රතික්ෂේප කරණු ලැබූ මුත් ඔවුන් වෙනුවෙන් වන්දිගෙවීමේ මරණයකින් මිය යැමට උවමනා විය. අනෙකුත් බොහෝ විස්තර - මේවා පැවසුවේ උන්වහන්සේගේ උපතට සියවස් ගණනකට පෙරවූ අතර යේසුස්වහන්සේගේ උපත, සේවය, මරණය සහ උත්ථානය ආකර්ෂණීය ලෙස සම්පූර්ණ විය.

නමුත් පුරෝකථන සටහන කෙලින්ම අපගේ දවස් කරා රැගෙන එන්නාවූ වැඩිදුර උදාහරණ දෙකකින් අපගේ කෙටි සමාලෝචනය අවසන් කරමු.

## බයිබලය සහ ජාතීන්

අධිරාජ්‍යයන්ගේ නැගීම සහ බැසීම පිළිබඳ චමත්කාරජනක සංක්ෂේපයක් සහ මධ්‍යදරණී මුහුද වටා පිහිටා යුරෝපීය ජාතීන්,

මැදපෙරදිග, මිසරය සහ උතුරු අප්‍රිකානු වෙරළ "ශිෂ්ඨ සම්පන්න ලෝකය" ලෙස හැඳින්වූ ජාතීන්ගේ තත්වය ගැන විස්තරයක් දානියෙල්ගේ පුරෝකථනයේ අඩංගුය. පුරෝකථනය ප්‍රකාශ කළේ, ක්‍රි.පූ. 6 වැනි සියවසේදී දානියෙල් බැබිලෝනි රජවාසලේ සිරකරුවෙකුට සිටියෙදිය. එම දවසේ සිට වර්තමානය දක්වා එහි සත්‍යය ඉතිහාසය තුළ ප්‍රදර්ශනය කර ඇත.

බැබිලෝනියේ රජුවූ නෙබුකද්නසර්, තමන්ගේම උඩගු බවින් සහ තේජසින් පිරී, කොටස් පහකින් සමන්විත මිනිසෙකුගේ මහා පිළිරුවක් සිහිනයෙන් දිටිය.

(1) පිළිරුවේ ශීර්ෂය රනින් විය.

(2) එහි ළය සහ බාහු රිදියෙන් විය.

(3) එහි උදරය සහ කලවා පිත්තලෙන් විය.

(4) එහි කකුල් යකඩයෙන් විය.

(5) නමුත් දෙපය සහ පා ඇඟිලි යකඩ සහ මැටි මිශ්‍රණයකින් සංයුක්ත විය.

එවිට "අතින් නොකැපූ පර්වතයෙන් කපන ලද" ගලක් දර්ශනය විය. එය පිළිරුවේ දෙපා මත වැටී, එය පොළව මත මහා හඬකින් කඩා වැටෙන්නට සලස්වා, එහි සියලු ධාතු සුණුකර ඒවා සුළඟට ගසාගෙන යන්නට සැලැස්විය. එවිට එම ගල මහා කන්දක්වී මුළු පෘථිවියම එයින් පිරවීය.

මෙම පිළිරුවේ ඉරණම ගැන නෙබුකද්නසර් මහත්සේ කැලඹුනේ ඔහුගේ එකදු ඥානවන්ත මිනිසෙකු හට එහි අරුත කියාදීමට නොහැකිවූ බැවිනි. නමුත් ඉශ්‍රායෙලයේ දිවැස්වරයාවූ දානියෙල් ප්‍රකාශකළේ:

"නමුත් රහසේ එළිදරව් කරන දෙවිකෙනෙක් ස්වර්ගයෙහි සිටින සේක. උන්වහන්සේ මතු දවස්වල සිද්ධවෙන්ට තිබෙන කාරණා නෙබුකද්නසර් රජුට දන්වා තිබේ." (දානියෙල් 2:18)

එසේ දානියෙල්, පිළිරුවේ අරුත විස්තර කළේය. නෙබුකද්නසර්ගේම විජිතය රන් ශීර්ෂය නියෝජනය කළේය. එය තවත් පහත් රාජ්‍යකින් (රිදී ළය සහ බාහු) උරුමකරන්නා අතර, එයද ඊට පසු තෙවැන්නකින් (පිත්තල)ය, පසුව සතරවැනි රාජධානියකින් (යකඩ කකුල්) ශක්තිමත්ව සහ ප්‍රචණ්ඩවය. නමුත් දෙපා සහ ඇඟිලි බෙදුනු රාජ්‍යයක්

නියෝජනය කළේ "කොටසක් සවිමත්වූ කොටසක් බිඳී" ලෙසය (37-42 පද)

එක් දෙයක් පැහැදිලිය: මෙම පිළිරුව බලවත් රාජ්‍යයන්ගේ අනුපිළිවෙලක් නියෝජනය කළ අතර ඒවා හඳුනා ගැනීමට අපහසු නැත. පළමුවැන්න අපි දනිමු. එය බැබිලෝනියානු අධිරාජ්‍යය විය. දානියෙල් 8 පරිච්ඡේදයේ (20-21 පද) එහි අනුප්‍රාප්තිකයෝ පර්සියාව සහ ග්‍රීසියවන්නේ යැයි අපහට පවසයි. "ශ්‍රෙෂ්ඨ සහ ප්‍රචණ්ඩ" සතරවෙනි බලය දානියෙල්ගේ පුරෝකථනයේ නිශ්චිතව නම්කර නැත. මෙම අනාවැකි සැහෙන ලෙස ඉතිහාසය ඔප්පු කරයි. ක්‍රි.පූ. 350 පමණ මීද සහ පර්සියානුන් විසින් බැබිලෝනි බලය පෙරලා දමා අවසානයේදී පර්සියානු අධිරාජ්‍යය පිහිටු විය. එය වසර 200 ක් පැවති අතර ක්‍රි.පූ. 330 පමණ මහා අලෙක්සැන්ඩර් විසින් එය පෙරලා දමා ග්‍රීක අධිරාජ්‍යය පිහිටු විය.

අලෙක්සැඩර්ගේ අනාප්‍රාප්තිකයන්ගේ රජධානි උරුමකර ගත්තේ කිනම් මහා බලවතෙක්ද? පිළිතුර ගැන සැකයක් ඇති විය නොහැක. එය රෝමානු අධිරාජ්‍යයයි. ක්‍රි.පූ. 20 වැනි සියවසේ සිට දිගටම රෝමානුවන් කලින් ග්‍රීක අධිරාජ්‍යයේ ප්‍රදේශ ආක්‍රමණය කළෝය. ඊළඟ වසර 500 දී රෝමය පෘථිවියේ ශ්‍රේෂ්ඨතම බලවතා විය. එහි අධිරාජ්‍යය ප්‍රායෝගිකව පළමු අධිරාජ්‍යවල් තුනේ සියලු ප්‍රදේශ ආවරණය කළ අතර, පුළුල්ව යුරෝපය, මැදපෙරදිග සහ මධ්‍යදරණී මුහුදු වටා ඇති සියලුම රටවල් කරා විහිදුනහ. එහි යටත් කර ගැනීම් කුරිරු කාර්යක්ෂමතාවයකින් ක්‍රියාවට නැගූ අතර එය "යකඩමෙන් ශක්තිමත්" යන හැඳින්වීම මැනවින් සංකේතවත් කළේය. එහි පැවැත්මේ අවසාන සියවස් දෙකේදී එය කොටස් දෙකකට බෙදන ලදී. රෝමය පාදක කරගත් බටහිර අධිරාජ්‍යය සහ කොන්ස්තන්තිනෝපල් පාදක කරගත් පෙරදිග අධිරාජ්‍යයය - පිළිරුවේ "කකුල්" දෙක.

## අභිරහස් හෙලිකරන දෙවිකෙනෙක්

නමුත් ක්‍රි.ව. 5 වැනි සියවසේ කැබලිවූ රෝමානු අධිරාජ්‍යයට කුමක් සිදුවීද? එය තවත් මහා අධිරාජ්‍යයක් විසින් ආදේශ නොකරන ලදී. එවන් එකක් ස්ථාපිත කිරීමට පරමාර්ථ කොටගත් මිනිසුන්ගේ උත්සාහයන්ට එරෙහිව එවන් සංසන්දනාත්මක විජිතයක් සහිත පස්වැනි අධිරාජ්‍යයක් කිසිදා නොවීය. රෝමානු අධිරාජ්‍යයේ ප්‍රදේශ, තමන්ගේම වෙන්වූ රාජ්‍යයන් පිහිටුවූවාගත් හන්, ගොත්, විසිගොත් සහ වැන්ඩල් මිලේච්ඡ ගෝත්‍රවල පහරදීම් යටතේ කැබලි විය. වර්තමාන යුරෝපීය ජාතීහු මෙම රාජ්‍යයන්ගේ අනුප්‍රාප්තිකයෝය. වසර 1500 ක ඔවුන්ගේ

ඉතිහාසය පුරා අද දක්වාම, යකඩ කොටසකින් සහ මැටි කොටසකින් යුත් පිළිරුවේ පාද මැනවින් සංකේතවත් කළාසේ, ඔවුහු බෙදුනු තත්වයකින් පවති. "..........කොටසක් සවි වන්නේය. කොටසක් බිඳී යන්නේය...... ඔවුහු එකිනෙකාට ඇලී නොසිටින්නෝය." (දානියෙල් 2:42-43)

නෙබුකද්නසර්ගේ ශ්‍රේෂ්ඨ විජිතය වෙනත් තුනකින් අදේශකරණු ලබන බවත්, සතරවැන්න විශේෂිත ලෙස ශක්තිමත් නමුත් පස්වැන්නකින් අදේශ නොකරණ බවත් දානියෙල් දැන සිටියේ කෙසේද? සතර වැන්නේ වැටීමෙන් පසු එහි අධිරාජ්‍යය ඒවා අතර ඒකත්වයක් නොමැතිව වෙන්වූ ප්‍රාන්ත වලට සිඳී බිඳී යන බැව් ඔහු දැනගත්තේ කෙසේද? සත්තකින්ම ඔහුට හෝ වෙනත් කිසිම මනුෂ්‍යයෙකු හට එවන් දෙයක් තමා විසින්ම දැනගත නොහැකිය. නමුත් දානියෙල් පැහැදිලි කිරීමකින් තොරව අප නොතබන්නේය.

> "රහස් එළිදරව් කරන දෙවිකෙනෙක් ස්වර්ගයෙහි සිටින සේක. උන්වහන්සේ මතු දවස්වල සිද්ධවෙන්ට තිබෙන කාරණා රජුට දන්වා තිබේ.......... ස්වප්නය සැබෑය. එහි අර්ථයද සත්තකය." (28, 45 පද)

වසර 2000කට අධිකව, වර්තමාන දවස දක්වාම අධිරාජ්‍යයන් සහ ජාතීන්ගේ ප්‍රවාහයන් නිශ්චිතවම අඩංගු, ක්‍රිස්තුස්වහන්සේට සියවස් ගණනාවක් පෙර පැවති දානියෙල් දෙවැනි පරිච්ඡේදයේ පුරෝකථනය වෙන කෙසේ පහදා දෙන්නේද? සැබැවින්ම "ස්වර්ගයේ දෙවිකෙනෙක්" සිටී නම් ඔබට එය වටහා ගැනීමට හැකිය. උන්වහන්සේ නොමැතිව, බුද්ධි ගෝචර විස්තර කිරීමක් නොමැත.

පිළිරුවේ දෙපා වලට ගල පහරදී එය බිම ඇද හෙලීම ගැන දර්ශනයේ අවසන් අදියර ගැන අවසන් කොටසේ අපි ප්‍රකාශ කරන්නෙමු. නමුත් අපගේ අවසන් පුරෝකථන උදාහරණය සඳහා මෙදෙස හැරෙමු.

## අපගේ කාලයන්

ඒවායේ සම්පූර්ණ වීම් වර්තමාන කාලය දක්වාම පැතිර ඇති නමුත්, මෙතෙක් දුරට සලකා බලන ලද පුරෝකථන ඇත අතීතයේ සිද්ධීන් ගැනය. (තම පෞරාණික දේශයට ඉශ්‍රායෙලයේ මෑත නැවත එකතුවේ ව්‍යතිරේකය සමඟ) මෙම දවස්වල අපට මගපෙන්වීමක් ලෙස, නූතන කාලයන් ගැන කිසිවක් කීමට බයිබල් පුරෝකථන වල ඇත්ද?

සත්තකින්ම එහි ඇත. මිනිස් සිතුවිල්ලේ විශ්වාසනීය බලාපොරොත්තු වලට එරෙහිව එය සාදන්නේ කෙතරම් අසමානතාවයක්ද? 19 වැනි සියවස සර්වසුභවාදී යුගයක් විය. මහත් සංවර්ධන සිදුවෙමින් පැවතින. වැඩිවන්නාවූ විද්‍යාත්මක දැනුම ඉක්මන් තාක්ෂණික දියුණුවට යොමුවුයේ මහත් කාර්මික නිශ්පාදන රැගෙනය. මෙය හැඟවුයේ වඩා සමෘද්ධියය. (අන්ත දුගී ජනතාවට නැතත්) සමාජයේ සියලු කොටස් වලට අධ්‍යාපනය ලබාගත හැකිවූ අතර සුභවාදී ප්‍රතිපල විශ්වාසවන්තව බලාපොරොත්තු වෙන ලදි. තර්කය වූයේ වඩා යහපත් අධ්‍යාපනයක් ලද අය සාහිත්‍යය, සංගීතය සහ චිත්‍ර වැනි කලාවන් කෙරෙහි වැඩි උනන්දුවක් දක්වනු ඇති බවයි. සමාජයේ පොදු සදාචාර විලාසය වැඩිදියුණු වනු ඇත. සැම සඳහා විනිශ්චයේ සමානත්වයේ සමාජ පිළිවෙලක් දේශපාලනඥයෝ පොරොන්දු වුහ. මිනිසුන් සුබිත මුදිත වන විට ඔවුන් එකිනෙකා කෙරෙහි ඊර්ෂ්‍යා කිරීම නවතනු ඇත. සටන් පාඨය වයේ "දුප්පත්කම තුරන්කරන්න, ඔබ අපරාධ තුරන් කරන්නේය." යන්නයි. මිනිස් මනසේ ඉස්තරම්ම බලයයන් සංවර්ධනය වූ විට, ජාතින් අතර සාමය ස්ථාපිත වනු ඇත. මුළු ලෝකය පුරා සුභාරංචිය පැතිරවීම සඳහා සභානායකයෝ විශ්වාසන්තව ඉදිරිය බැලුවෝය. මිනිස් ප්‍රගමණය සහ දියුණුව, පුද්ගලයා තුළ සහ සමජය තුළ, වලංගු වී යැයි පිළිගන්නා ලදි. අනාගතය දීප්තිමත් විය.

## සාමය සහ අභිවෘද්ධිය ?

20 වැනි සියවසේ සිද්ධීන් කොපමණ කම්පාකරවන සුදු වීද? අභිවෘද්ධියේ සහ සාමයේ සිහිනය බොඳ වී ගොසිනි. මිලියන ගණනක් ඝාතනය කර, ගැණිය නොහැකි අලාභ සහ විඳවීම් සමඟ දරුණු ලෝක යුද්ධ දෙකක් පසුපස අතිභයානක විනාශකාරී ආයුධ නිපදවා ඇත. 19 වැනි සියවසේ "නැතවත් මිනිසුන්" විශ්වාසය තැබූ විවිධ විසඳුම්, මුසාවන් ලෙස එළිදක්වා ඇත. වඩා පුලුල්ව පැතිරුණු අධ්‍යාපනය පසුපස පැමිණ ඇත්තේ ඉහළ සදාචාරාත්මක ප්‍රමිති නොව, වංකකමේ, කැදරකමේ, ප්‍රචණ්ඩත්වයේ සහ අපරාධයේ වැඩිවීමය. ක්‍රිස්තියානි ආගම, ජාතින් පර්වර්තනය කරනවා වෙනුවට, මුළු පෘථිවිය පුරාම පිරිහී ඇත. දේශපාලනයේ ප්‍රජාතන්ත්‍රවාදය සමාජීය දුෂ්ඨකම් කෙරෙහි බලාපොරොත්තුව, මැජික් සුවය ලබාදී නොමැත. අවසානයේ - දරුණුතම පහරවන - විද්‍යාව දෙපැත්ත කැපෙන භයානක ආයුධයක් ලෙස ඔප්පුවී ඇත. සාමයේ යුගයක් වනවා වෙනුවට, මෙම "ශිෂ්ටසම්පන්න" 21 වැනි සියවස අරගල සහ ප්‍රචණ්ඩත්වයේ යුගයක් වී ඇත. බොහෝ අයගේ ආකල්පය සර්ව අශුභවාදී විඳදරා ගැනීමක් වීම පුදුමයක් නොවේ. කෙනෙකුට කිසිවක් නොකළ හැකිසේ පෙනේ.

දැන්, මේ සියල්ල ගැන බයබල් පුරෝකතනවල කිමට ඇත්තේ කුමක්ද?

පෘථිවිය තුළ මිනිසාගේ ප්‍රගමනය තිරණාත්මක ලකෂණයකට පැමිණෙන "අන්තිමයේ දවස්" , "අවසන් කාලය" ගැන පැහැදිලි ඉදිරි දැක්මක් එය සතුය. එය සංවර්ධනයේ සහ සාමය පැවැත්මේ චිත්‍රයක් නොව කරදර සහ භීතිය සහිත ලෝකයකය. මෙහි පැහැදිලිම සහ වඩාත් සිත්ගන්නා උදාහරණය, යේසුස්වහන්සේ තම ගෝලයන්ට කියූ දෙයෙහි හමුවේ. ඒ ඔවුන් උන්වහන්සේ නැවත පෘථිවියට පැමිණීමේදී ඇතිවන සලකුණ සහ "ලෝකයේ අවසානය" විමසූ විටය. ප්‍රථමයෙන් උන්වහන්සේ ඔවුනට යුදෙව් ජනතාවගේ ඉරණම ගැන පවසන සේක.

> **"ඔවුහු (යුදෙව්වෝ) කඩු මුහතින් වැටෙන්නෝය. සියලු ජාතීන් අතරට වහලුන් මෙන් ගෙනයනු ලබන්නෝය. අන්‍යජාතීන්ගේ කාලවල් සම්පූර්ණවනතෙක් යෙරුසලෙම අන්‍යජාතීන් විසින් මඩිනු ලබන්නීය." (ලූක් 21:24)**

මේ අප දැනටමත් ඉශ්‍රායෙලය සම්බන්ධව පුරෝකථනයේ සලකා බැලූ කෙටි විස්තරයකි. යුදෙව්වන් වහලුන් ලෙස සියලු ජාතීන් අතරට එලවා දැමීමට තිබුණි. යෙරුසලෙම අන්‍යජාතික බලයයන් යටතට පත්වන්නට තිබින. යේසුස්වහන්සේ මෙයට සීමාවක් අදහස් කරන සැටි බලන්න. "අන්‍යජාතින්ගේ කාලවල් සම්පූර්ණ වන තෙක්". මෙහි ආරම්භය අපගේම දවස්වල අපි දුටුවෙමු. යෙරුසලෙම තව දුරටත් "විදෙස්" බලයයන්ගේ ආධිපත්‍යය යටතේ නොමැත. එය ඉශ්‍රායෙලයේම පාලනය යටතේය.

## ලෝක ව්‍යසනය සහ භීතිය

ඉතින් ඔහු ඊලඟට පවසන දෙය එම දවස් වලටම බලපෑ යුතුය. එනම් තමන්ගෙම භූමියට ඉශ්‍රායෙල්ගේ ප්‍රතිස්ථාපනය දවස්ය. ඔහු පෙර දකින්නේ මෙයයි.

> **"ඉර සඳ හා තාරකාවන් කෙරේ ලකුණ හා මුහුදේ රැල ගැසීමේත් ඝෝෂාව නිසා වන වියවුලෙන් පොළවේ ජාතීන්ට දුක්වේදනා වන්නේය. මක්නිසාද ආකාශයේ පරාක්‍රමධාරීන් සොලවනු ලබන බැවින් භයෙනුත් ලෝකයට පැමිණෙන්නාවූ දේ බලාපොරොත්තුව සිටීමෙනුත් මනුෂ්‍යයන්ගේ සිත් ක්ලාන්තවන්නේය."** (25-26 පද)

මෙය සාමයේ සහ වර්ධනයේ චිත්‍රයක් නොවේ. එය ව්‍යසන සහ

ව්‍යාකූලතාවයේ ලෝකයකි. (යේසුස්වහන්සේ පාවිච්චි කළ වචනය, වචනයේ පරිසමාප්තියෙන්ම හැඟවූ ලෙස) "වාසයකරගත් පෘථිවිය" මත සිදුවන සිද්ධීන් මෙනෙහි කිරීමෙන් මිනිසාගේ හදවත් භීතියෙන් ඩැහැගන්නා ලෝකයකි.

යේසුස්වහන්සේගේ පුරෝකථනයේ කාලයට වසර 35 කට පමණ පසු ලියමින්, අන්තිමයේ දවස්වල ලක්‍ෂණ ගැන මෙසේ පවසන්නට අපෝස්තුලුවර පාවුල්ට තිබේ.

**"අන්තිම දවස්වලදී අන්තරා සහිත කාලවල් පැමිණෙන බව දැනගන්න. මක්නිසාද මනුෂ්‍යයෝ තමුන්ටම ප්‍රේමකරන්නෝව, මුදලට ප්‍රේම කරන්නෝව, පාරට්ටුකරන්නෝව, උදාරම්කාරයෝව, අපහාසකරන්නෝව, මවුපියන්ට අකීකරුවන්නෝව, ස්තුතිවන්ත නොවන්නෝව, අභක්තිකයෝව, ජන්ම ස්නේහය නැත්තෝව, සමාදාන නොවන්නෝව, කේලම් කියන්නෝව, තෘෂ්ණාව මැඩපවත්වා නොගන්නෝව, කාරයෝව, යහපතට ප්‍රේම නොකරන්නෝව, ද්‍රෝහියෝව, හිතුවක්කාරයෝව, අහංකාරයෝව, දෙවියන් වහන්සේට වඩා සැප සෙල්ලමට ප්‍රිය කරන්නෝව, දේව භක්තියේ වේශය දරණ නමුත්, එහි බලය එපා කළ අයව සිටින්නෝය........." (2 තිමෝති 3:1-5)**

මෙය ශිෂ්ඨාචාරයක මවිත කරණ සුලු චිත්‍රයකි. මිනිසා විපාක නොතකා, සියලු බාධක ඉවත දමා තම තෘෂ්ණාවන් තුළම ආශාවෙන් ගැලෙයි. අපේම ලෝකයෙහි සංවර්ධනය වන එහි අභූත සමානතාවය ප්‍රතික්ෂේප කළ නොහැකිය.

ඉතින්, තත්වය මෙයයි. වසර 100 ක් ඉහතදී "නැනවත් මිනිසුන්" ලෝකයේ ජාතීන් හට ප්‍රගමනයේ සහ සාමයේ යුගයක් විශ්වාසවන්තව බලාපොරොත්තු වුවද, බයිබලය, යේසුස්වහන්සේගේ සහ පාවුල්ගේ වදන් වලින් ව්‍යසනයේ, භීතියේ සහ ව්‍යාකූලතාවයේ ලෝකයක්, ප්‍රචණ්ඩත්වය, අසංවරය සහ වෛරය පිරී යුගයක් ප්‍රකාශ කළහ. අපගේ මනුෂ්‍ය දර්ශනවාදීන් වැරදී විය. යේසුස්වහන්සේ සහ පාවුල් නිවැරදිය. නමුත් ඔවුන් ප්‍රකාශ කළේ සහ ලේඛන ගත කළේ වසර 1900 කට ඉහතදීය....... ! ඔවුන් දැනගත්තේ කෙසේද? ඔවුන් කිසිවෙක් දෙවියන්වහන්සේගේ වචන මිස තම වචන කථා නොකළ බැවිනි. අන්තිමයේ දවස්වල ගති ලක්‍ෂණ එළිදරව් කිරීමට තමන්වහන්සේගේ පුත්‍රයා සහ උන්වහන්සේගේ අපෝස්තුලුවරයා හට අනුග්‍රහය දැක්වූ දෙවියන්වහන්සේ එය දැන සිටි සේක.

## නිගමනයන්

අපගේ මෙම බයිබල් පුරෝකථන සලකා බැලීමේදී වැදගත් නිගමනයන් කිහිපයකට පැමිණිය හැක.

මිනිස් ඉතිහාසය - බැබිලෝනියේ, මීසරයේ සහ ඉශ්‍රායෙලයේ ඉරණම් මෙන්ම අධිරාජ්‍යයන්ගේ නැගීම සහ බැසීම යන නූතන ලෝකයේ තත්වය පිළිබඳ ඉසව් වල අනාවැකි එසේ නිවැරදිව සැබෑ ලෙස බයිබලය ඔප්පුකර ඇති නම්, පැමිණෙන්නට ඇති ඉසව් පිළිබඳ අනාවැකි නිවැරදි වන්නට බැරිද?

උදාහරණයකට, දානියෙල්ගේ එම පිළිරූ දර්ශනය ගන්න. අප මෙතෙක් දුරට අවසාන වර්ධනය ගැන ප්‍රකාශයක් කර නොමැත. "අතින් නොකැපූ" ගල පිළිරුවේ පාදවලට පහරදී එය විනාශ කොට, එයම "මහත් කන්දක් වී, මුළු පොළව එයින් පිරුණේය. (දානියෙල් 2:35) දැන් මෙහි සාමාන්‍යය අර්ථය සරලය. අලුත් සංඝටකයක්, පිළිරුවේ අධිරාජ්‍යයන් සහ රාජ්‍යයන්ගේ කොටසක් නොව, ඒවා විනාශ කොට, පෘථිවිය තුළ ඒවායේ ස්ථානය ගන්නේය. "අතින් නොකැපූ" යන්න "මිනිස් අත්පලින් නොකැපූ" යන්න හඟවන නිසා, එම ගල නියෝජනය කළ යුත්තේ සාමාන්‍ය මිනිස් බලය නොවේ.

නමුත් එය පවසන්නේ කුමක්දැයි දානියෙල්ම අපට පවසයි:

> "ඒ රජුන්ගේ දවස්වලදී (එනම්, රෝමානු අධිරාජ්‍යයට පසු පැමිණි විවිධ රාජ්‍යයන්) ස්වර්ගයේ දෙවියන්වහන්සේ කිසිකලෙක නැති නොවන්නාවූ රාජ්‍යයක් පිහිටුවන සේක.......... ඒක ඒ සියලු රාජ්‍යවල් පොඩිකර නැතිකරන්නේය. එයද සදාකාලේටම පවතින්නේය." (44 පදය)

දෙවියන්වහන්සේ මැදිහත්වී තමන්වහන්සේගේම රාජ්‍යය පිහිටුවන විට ලෝකයේ වර්තමාන රාජ්‍යය සහ බලයයන් හදිසි අනපේක්ෂිත සිද්ධියකින් පහකිරීමට නියමිතය. වැරදි වැටහීමක් නොවන්නට, විනාශවන්නේ පෘථිවියේ ජනගහනය නොවේ යැයි පැවසිය යුතුය. දෙවියන්වහන්සේගේ අලුත් රාජ්‍යය විසින් පහකරණුයේ ඔවුන්ගේ මිනිස් රාජ්‍යයන්ගේ බලය සහ අධිකාරියයි. අනෙකුත් බොහෝ පුරෝකථන මෙම රාජ්‍යයේ ස්වභාවය ගැන පවසයි. එහි පාලනයේ දැහැමිභාවය, එහි ධර්මයේ සත්‍යතාවය සහ "ස්වර්ගයේ දෙවියන්වහන්සේ" ඔවුන් හඳුනා ගැනීම තුළින් අවසානයේ මිනිස් වර්ගයා සඳහා රැගෙන එන සාමයයි.

පැමිණෙන යුගයේ ජාතීන්ගේ පැහැදිලි සහ අපූර්ව රූපයක් සඳහා උදාහරණයක් ලෙස යෙසායා 2:1-4 කියවන්න.

නමුත් නිශ්චිතවම පෘථිවියේ මෙම මහත් වෙනස් කිරීම කෙසේ සිදු කරන්නේද? නව ගිවිසුම අපට පවසයි. ඇත්ත වශයෙන්ම යේසුස් වහන්සේ තමන්වහන්සේගේ සියලු ජාතීන් සඳහා කරදරකාරී සහ බියජනක කාලවල් ගැන පුරෝකථනයේදී එය පවසයි. උන්වහන්සේගේ ඊළඟ වදන් මෙසේය.

"එකල මනුෂ්‍ය පුත්‍රයා බලයෙන් සහ මහත් තේජසින් යුක්තව වළාකුලකින් එනවා ඔවුහු දකින්නෝය." (ලූක් 21:27)

උන්වහන්සේ පවසන්නේ උන්වහන්සේම නැවත එන බවයි. පෘථිවිය මතට ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීම, නව ගිවිසුම තුළ යේසුස්වහන්සේගේ සහ අපෝස්තුලුවරුන්ගේ චිත්‍රයක් සඳහා ගීතාවලිය 72 කියවන්න.

දැන් සත්තකින්ම අප සැලකිලිමත් විය යුත්තේ මෙයිනි. වසර 2000 කට අධිකව ජාතීන් සහ අධිරාජ්‍යයන් ගැන බයිබලයේ පුරෝකථන වල සත්‍යතාවය ඔප්පු වී ඇත්නම්, ඒවා අනාවැකි පවසන අනෙකුත් දේද ඉටු නොවන්නේද? මෙසේ පැවසීම අසාධාරණ නොවේද: "මෙම ඓතිහාසික කරුණු වලදී අනාගතවක්තෘන්ගේ අනාවැකි නිවැරදි බැව් මම පිළිගනිමි, නමුත් අප සඳහා අනාගතය ගැන ඔවුන් පවසන දේ මට පිළිගත නොහැක." එසේ නොවන්නේ ඇයි? දෙවියන්වහන්සේගේම අභිප්‍රාය මිස, තමන්ගේම අදහස් වාර්තා නොකරන බැව් ඔවුන්ම සාක්ෂි දරා ඇත. ඔවුන් පවසන ඉතිරිය කුමක් හෝ අපගේ මහත් පරීක්ෂාකාරී අවධානයට ලක්විය යුතුය.

## සක්‍රීය සංඝටකය

නිසැකවම තවත් බොහෝ දේ තිබේ. මම අපූර්ව පුරෝකථන බයිබලයේ මිස ලෝකයේ කොතැනක හෝ හමු නොවේ. බයිබලය හා සැසඳීම ඇරඹීමටවත් වෙනත් කිසිම ලියැවිල්ලක්, පොතක්, මිනිස් ප්‍රකාශනයක් නොමැත. නමුත්, යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාවූ බැව් බයිබලය අපට පවසයි. නව ගිවිසුමේ සුභාරංචි තුළ උන්වහන්සේ කිදේ අප සඳහා සුරක්ෂිතව ඇත. උන්වහන්සේගේ අනුග්‍රාහික අපෝස්තුලුවරුන් වූ පේතෘස්, යොහන් සහ පාවුල්ගේ ඉගැන්වීම් සමඟ වෙනත් කිසිම ආකාරයකින් අපට දැනගන්නට නොහැකි

සත්‍යයන් ඒවා එළිදරව් කරයි. මරණයේ සත්‍යතාවය ගැන ඒවා අපට අවවාද කරයි. සුභාරංචිය "සුභ ආරංචිය" "ගැලවීම පිණිස දෙවියන් වහන්සේගේ බලය" (රෝම 1:16) වන්නේ ඇයි දැයි ඒවා විස්තර කරයි. ක්‍රිස්තුස්වහන්සේ පැමිණි විට ස්ථාපිත කරණ අලුත් පිළිවෙල තුළ නිත්‍ය ජීවිතයක් ගැන පොරොන්දුවකින් ඒවා අප ධෛර්යමත් කරයි. අප බයිබලය කියැවිය යුත්තේ එහෙයිනි. මරණයේ බලාපොරොත්තු සුන් භාවය සහ සදාකාල ජීවිතයේ විශ්වාසවන්ත බලාපොරොත්තුව අතර අප සඳහා සක්‍රිය වෙනස සිදු කිරීමට එයට හැකිය.

බයිබලය අවධානයෙන් යුතුව කියැවීමෙන් දෙවියන්වහන්සේ වැඩ සිටිනා බවත්, සියල්ල උන්වහන්සේගේ පාලනය යටතේ බවත්, තම පුත්‍රයාණන්ගේ ගෝලයන් වීමට උන්වහන්සේ අප කැඳවන බවත් අපට තහවුරු වේ. බයිබලය අප සඳහා ග්‍රන්ථයය. එය ප්‍රකාශ කරන්නාවූ දේ ගැන අවධානය යොමු කිරීම අපට යහපත්ය.

**- ෆෙඩ් පියර්ස් -**

## බයිබල් පුරෝකථන ප්‍රශ්න :-

1. ඉශ්‍රායෙල්ගේ දවස්වල, තමන් සත්‍යයැයි පෙන්වීමට ජාතීන්ගේ දෙවිවරුන් හට, මැවුම්කාරවූ දෙවියන්වහන්සේ අභියෝග කළේ කෙසේද? දෙවියන්වහන්සේගේ ප්‍රතිචාරය කුමක් වීද ? අද ඔබ ජීවත් වන රටෙහි, මෙම පරීක්ෂණය අදටත් වලංගු දැයි ඔබ සිතන්නේද ?

2. අනාගතය සඳහා අනැවැකි ප්‍රකාශ කිරීමේ බලය අයත්වන්නේ කාහටද?

3. සැකයකින් තොරව ඔබ විශ්වාස කරන පරිදි, එම සිදුවීම් සිදුවන්නට පෙර ලියැවූ බයිබලයේ ප්‍රකාශිත පුරෝකථන උදාහරණ 3ක් දෙන්න.

4. ක්‍රි. පූ. 200 දී පමණ පැරණි ගිවිසුම් ශුද්ධ ලියවිලි ග්‍රීක බසට පරිවර්තනය කරන ලද්දේ නම්, යේසුස්වහන්සේගේ පැමිණීම පිළිබඳ පැරණි ගිවිසුම් පුරෝකථන මොනවාද ? ඒවා පවසන්නේ කුමක්ද ?

   උපකාරයක් ලෙස මෙම හෝඩුවාවල් අපි ඔබට දෙන්නෙමු ගීතාවලිය 22, යෙසායා 7 සහ 53 පරිච්ඡේද සහ මීකා 5 පරිච්ඡේදය කියවන්න.

5. පහත සඳහන් දේ සම්බන්ධ පුරෝකථන ඔබගේම වචනයෙන් විස්තර කරන්න.

   ✸ මිසරය ✸ ඉශ්‍රායලය

   මෙම පුරෝකථන වල ඔබ වඩාත්ම සිත්ගත්දේ පිළිබඳ විස්තර මොනවාද ? දෙවියන්වහන්සේ වැඩ සිටීම පිළිබඳ සාක්ෂි ලෙස ඒවා ඔබ පිළිගන්නේද ?

6. බයිබල් පුරෝකථන සම්පූර්ණ වීම හෝ තම ජනතාව වෙනුවෙන් දෙවියන්වහන්සේගේ සහභාගීත්වය තුළ, පසුගිය වසර 100 ඇතුලත ඉශ්‍රායෙල් ජාතිය සම්බන්ධව ඇති වූ ඉසව් මොනවාද ?

7. දානියෙල් 2 වැනි පරිච්ඡේදයේ, රජෙකුගේ සිහිනයත් එහි විසඳුමත් ඇත.

   (අ) රජතුමා සිහිනෙන් දුටුදේ පැවසීමට දානියෙල්ට හැකිවූයේ කෙසේද ?

   (ආ) සිහිනයේ අරුත පිළිබඳ දානියෙල් දුන් විස්තරය කුමක්ද ?

   (ඇ) පිළිරුවේ දෙපා මත වැදෙනා ගල, එනම් සිහිනයේ අවසන් සංඝටකය පිළිබඳ දානියෙල්ගේ විස්තරය කුමක්ද ?

8. දිවැස්වරු, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ අපෝස්තුලුවරු සියල්ල, අනාගතයේදී සිදුවන්නට නියමිත ඉසව් පිළිබඳ ප්‍රකාශ කරත්. මෙම ඉසව් මොනවාද ? සිදුවන්නේ කුමක්ද ? මේ සිදුවීම් සිදුවේයැයි ඔබ පිළිගන්නවාද ?